## උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් පහත සඳහන් **වගුව – I** හි දක්වා ඇති තනතුරු පුරප්පාඩුවලට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් 2018 **අගෝස්තු / සැප්තැම්බර් යන මාස තුළ** යාපනයේ පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනුයේ 25.07.2018 වැනිදා ය.

- **වගුව – I**

| විභාගයේ නම | තනතුරු අංකය | පුරප්පාඩු පිළිබඳ විස්තර |
|---|---|---|
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කෘෂිකාර්මික උපදේශක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය – 2018 | **01** | **47** |
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කෘෂිකාර්මික උපදේශක සේවයේ පුහුණු ගණයට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය – 2018 | **02** | |
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහකාර (කෘෂි ව්‍යාප්තිය) සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය – 2018 | **03** | **71** |
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ ජලජ ජීවී (Auqa Culture) සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය – 2018 | **04** | **10** |

**02. බඳවා ගැනීමට සඳහා සේවා කොන්දේසි :-**

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද **I** වන වගුවේ දක්වා ඇති තනතුරුවලට අදාළ සේවා ව්‍යවස්ථාවන් / බඳවා ගැනීමේ පරිපාටීන් හි නිර්දේශිත කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** හා **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවා ආයතන සංග්‍රහයේ යනාදිට අනුකූලව හා බඳවා ගන්නා කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වන කිසියම් සංශෝධනයන්ට ද යටත් කර තේරීපත්වන අපේක්ෂකයන් **I** වන වගුවේ දක්වා ඇති තනතුරුවල III වන ශ්‍රේණියේ හෝ පුහුණු ගණයට (කෘෂිකාර්මික උපදේශක) පත් කරනු ලැබේ

02.2 තරග විභාගයෙන් III වන ශ්‍රේණියට සමත් වන විභාග අපේක්ෂකයන් පත්වීම් දිනය සිට වසර තුනකට (03) පරිවාස කාලයට යටත් කර එම පදනම මත III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉහත තනතුරුවල III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක (03) කාලය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 තරග විභාගයෙන් කෘෂිකර්ම උපදේශක පුහුණු ගණයට සමත්වන විභාග අපේක්ෂකයන් සම්පූර්ණ පුරප්පාඩුවලින් 30% ක් නොඉක්මවන ප්‍රමාණයකින් කෘෂිකාර්මික උපදේශක පුහුණු ගණයට පත් කරනු ලැබේ. මෙම පුහුණුකරුවන් පුහුණු කාලය තුළ මධ්‍යම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කෘෂිකාර්මික පුහුණු පාසලක අවුරුදු දෙකහමාරක කෘෂිකාර්මික ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් විය යුතුයි. මෙම කාල සීමාව තුළ මාසික දීමනා සමඟ අධ්‍යාපන නිවාඩු ප්‍රදානය කෙරේ.

02.4 මෙම සේවාව ස්ථාන මාරු සහිත සේවාවකි. එබැවින් මෙම පත්වීම ලබන අපේක්ෂකයන් උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන කොන්දේසියට යටත්විය යුතුයි.

02.5 එක් සේවා ස්ථානයකට පත්වීම් ලබන්නා, එම සේවා ස්ථානයේ අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවය කළ යුතු බව අනිවාර්‍ය කොන්දේසියකි.

02.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා සම්බන්ධයෙන් ද එය අනුගමනය කරමින් නිකුත් කරනු ලබන චක්‍රලේඛණයන්ට අනුව පත්වීම් දින සිට වසර පහක් (05) අවසන් වීමට ප්‍රථම නිශ්චිත කර ඇති දෙවන රාජ්‍ය භාෂාවට භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

02.7 පත්වීම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක වන දින පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් පුරප්පාඩු කිහිපයක් හෝ පුරප්පාඩු සියල්ල පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය. පත්කිරීමට නියමිත ගණන **I වන** වගුවේ දක්වා ඇති පරිදි වේ.

## 03 වැටුප් පරිමාව :-

### 03.1 කෘෂිකාර්මික උපදේශක III වන ශ්‍රේණියට අදාල වැටුප්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **MN 3 - 2016** ට අනුව කෘෂිකාර්මික උපදේශක සේවයේ III ශ්‍රේණියට අදාල සමුච්චිත වැටුප් අනුපාතය රුපියල් **31, 040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/-** වේ. (රුපියල් 31,930 වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛයේ II වන වගුවේ සඳහන් වන විධිවිධානයන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

### 03.2 කෘෂිකාර්මික උපදේශක පුහුණු ගණයට අදාල වැටුප

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 V වන වගුවේ සඳහන් පරිදි, (මාසික දීමනා හා ගැලපුම් දීමනා ගෙවනු ලැබේ)

1 පළමු වර්ෂය - **රුපියල් 21,532.00** + ගැලපුම් දීමනා

2 වන වර්ෂය - **රුපියල් 21,770.00** + ගැලපුම් දීමනා

### 03.3 තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්ත) III වන ශ්‍රේණියට අදාල වැටුප්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **MT 1 - 2016** ට අනුව තාක්ෂණික සහකාර (කෘෂි ව්‍යාප්තිය) සේවයේ III වන ශ්‍රේණියට අදාල සමුච්චිත වැටුප් අනුපාතය රුපියල් **29, 840 – 10 x 300 - 11 x 350 - 10 x 560 – 10 x 660 – 48,890/-** වේ. (රුපියල් 30,440 වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛයේ II වන වගුවේ සඳහන් වන විධිවිධානයන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

### 03.4 ජලජ ජීවීන් සංවර්ධන නිලධාරී III වන ශ්‍රේණිය සඳහා වන වැටුප

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **MN 1 - 2016** ට අනුව ජලජ ජීවී සංවර්ධන නිලධාරී III වන ශ්‍රේණියට අදාල සමුච්චිත වැටුප් අනුපාතය රුපියල් **27,140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45,540/-** වේ. (රුපියල් 27,740 වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛයේ II වන වගුවේ සඳහන් වන විධිවිධානයන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාතේ කුමන ප්‍රදේශයක හෝ සේවය කිරීමට හැකි වන පරිදි මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් පසුවිය යුතු වන අතර මනා චරිතයකින් යුත් පුද්ගලයකුව සිටිය යුතුයි.

04.3 අ) අයදුම්කරුවන් උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. මෙම අයදුම්පතේ අවසාන දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

**නැතිනම්**

ආ) අයදුම්කරුවන් නැතිනම් දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොට අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිකරුවන් විය යුතුයි.(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ඡන්ද ලැයිස්තුවෙ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)

04.4 අයදුම්පත් ඉදිරිපත් කරන අවසාන දිනයට හෝ එයට ප්‍රථම මෙම තනතුරට අදාලව කැඳවා ඇති **සියළුම සුදුසුකම්** අයදුම්කරුවන් සතුව තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

### 05.1 කෘෂිකාර්මික උපදේශක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා:- (තනතුරු අංකය – 01)

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් එකවර **භාෂාව හෝ සාහිත්‍යය** (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්යන් සමඟ විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.

**හෝ**

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විද්‍යාව විෂය ධාරව තුළ ජීව විද්‍යාව, රසායනික විද්‍යාව **සමඟ** කෘෂිකර්මය / භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් කුමක් හෝ විෂයක් ඇතුළු විෂයයන් තුනක් (03) එකවර ම සමත්වී තිබීම

**ඒ සමඟම**

**ආ) වෘත්තිය සුදුසුකම් :-**

1. කුණ්ඩසාලය, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂි කර්ම විද්‍යාලවලින් එක් විද්‍යාලයක වසර දෙකක (02) කෘෂිකර්මය සඳහා ඩිප්ලෝමා සහතිකය හිමිකර තිබීම.

   **හෝ**

   අම්පාර හාඩි තාක්ෂණික ආයතනයේ තාක්ෂණවේද කෘෂිකර්ම පිළිබඳ ඩිප්ලෝමා සහතික හිමිකර තිබීම.

   **හෝ**

   ඇක්වයිනස් (Aquinas) උසස් අධ්‍යාපන විද්‍යායතනයේ වසර (02) ක කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා හදාරා තිබීම.

   **හෝ**

2. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත තාක්ෂණවේදය පිළිබඳ සහතික ප්‍රදානය කරන ආයතනයන් හි අදහස් දැන ගැනීමෙන් අනතුරුව අවශ්‍යතාවය මත ඉහත තාක්ෂණවේදය සම්බන්ධ සුදුසුකම්වලට සෑම අතින් ම සමාන බවට තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත වෙනත් තාක්ෂණික සුදුසුකම්.

   **හෝ**

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධිධාරි උපාධියක් ලබා තිබිය යුතුයි.
   - අ. කෘෂිකාර්ම විද්‍යාවේදී උපාධිය [B.Sc (Agriculture)]
   - ආ. කෘෂිකාර්ම තාක්ෂණවේදී හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය [B.Sc (Agriculture Technology and Management)]
   - ඇ. අපනයන කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය [B.Sc (Export Agriculture)]
   - ඇ. පාම් (Palm) හා රබර් කිරි තාක්ෂණ විද්‍යාවේදී උපාධිය [B.Sc (Palm and Latex Technology)]

**ඇ) වයස් සීමාව :-**

අයදුම්පත කැඳවීමේ අවසාන දිනට අපේක්ෂකයා **වයස අවුරුදු** 18 ට නොඅඩු, හා **වයස අවුරුදු 30** ට නොවැඩි විය යුතුයි.

### 05.2 කෘෂිකර්ම උපදේශක සේවයේ පුහුණු ගණය සඳහා:- (තනතුරු අංකය – 02)

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් **එකවරම භාෂාව හෝ සාහිත්‍යය** (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්යන් සමඟ විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.

**ඒ සමඟම**

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විද්‍යාව විෂය ධාරව තුළ ජීව විද්‍යාව, රසායනික විද්‍යාව **සමඟ** කෘෂිකර්මය / භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් කුමක් හෝ එක් විෂයක් ඇතුළු විෂයයන් තුනක් (03) **එකවර ම** සමත්වී තිබීම

**ආ) වයස් සීමාව :-**

අයදුම්පත කැඳවීමේ අවසාන දිනට අපේක්ෂකයා **වයස අවුරුදු 18** ට නොඅඩු, හා **වයස අවුරුදු 30** ට නොවැඩි විය යුතුයි.

**05.3 කෘෂිකාර්මික සහකාර (කෘෂි ව්‍යාප්තිය) III වන ශ්‍රේණියේ තනතුරු සඳහා:- (තනතුරු අංකය – 03)**

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් **දෙවරකට** නොවැඩි වාරවලදී **භාෂාව හෝ සාහිත්‍යය** (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, යන විෂයයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සමඟ විෂයයන් හයක් (06) සමත්වි තිබිය යුතුයි. මෙයින් එක්වරම අවම වශයෙන් විෂයයන් පහක් 05) සමත්වි තිබිය යුතුයි.

**ඒ සමගම**

**ආ ) වෘත්තීය සුදුසුකම්:-**

1. රජය විසින් අනුමත ආයතනකින් වසර දෙකක කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුයි.

**හෝ**

2. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 01/2012 දරණ චක්‍රලේඛය ප්‍රකාර මෙම තනතුරට සුදුසු ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 05 (NVQ Level – 05) තාක්ෂණ සහතික සුදුසුකමක් සේ ලබා තිබිය යුතුයි.

**හෝ**

3. ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමානව තෘතියික වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් තාක්ෂණික සුදුසුකම්.

**ඇ) වයස් සීමාව :-**

අයදුම්පත කැඳවීමේ අවසාන දිනට අපේක්ෂකයා **වයස අවුරුදු 18** ට නොඅඩු, හා **වයස අවුරුදු 35** ට නොවැඩි විය යුතුයි.

**05.4 ජලජ ජීවි සංවර්ධන නිලධාරි III වන ශ්‍රේණියේ තනතුර සඳහා :- (තනතුරු අංකය – 04)**

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් **එකවරම භාෂාව** (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, යන විෂයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්යන් සමඟ විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.

**ඒ සමගම්**

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විද්‍යාව විෂය ධාරාව තුළ අවම වශයෙන් එක් විෂයක් සමත්වි තිබිය යුතුයි. (සාමාන්‍ය විභාගය හා ඉංග්‍රීසි හැර)

**ඒ සමගම**

**ආ) වෘත්තීය සුදුසුකම් :-**

රජය විසින් අනුමත ආයතනකින් ධීවර / ජලජ ජීවීන් සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දෙකක (02) ඩිප්ලෝමා විෂය ධාරාව අපේක්ෂකයන් විසින් සාර්ථකව හදාරා සම්පූර්ණ කර තිබිය යුතුයි.

**ඇ) වයස් සීමාව :-**

අයදුම්පත කැඳවීමේ අවසාන දිනට අපේක්ෂකයා **වයස අවුරුදු 18** ට නොඅඩු, හා **වයස අවුරුදු 40** ට නොවැඩි විය යුතුයි.

## 06 බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත විභාගය මගින් කුසලතා පදනම මත, බඳවා ගනු ලබන අවස්ථාවේ ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ ක්‍රමයන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන් පරිදි ද I වන වගුවේ දක්වා ඇති තනතුරුවලට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීමේ කැඳවා ඇති සියළුම සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂාවට ලක් කරන අතර අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර ලැබීමේ හිමිකම අහෝසිවනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසකම් හා ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා ලකුණු කිසිවක් ප්‍රදානය කරන්නේ නැත.

06.2 ඉහත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබා ගත් සම්පූර්ණ ලකුණු පිළිවෙලින් පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීමට සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3 කෘෂිකර්ම උපදේශක තනතුරේ බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III තුන්වන ශ්‍රේණියට බඳවා ගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී ඉතිරි පුරප්පාඩු, පවතින පුරප්පාඩුවලින් 30% ට නොවැඩිව පුහුණු ශ්‍රේණියට බඳවා ගන්නා අය සමග සම්පූර්ණ කරනු ලැබේ.

06.4 පුරප්පාඩුවලින් 03% ක් ආබාධිතයන් සඳහා (අංග විකල) වෙන් කරනු ලැබේ. අපේක්ෂකයන් පත්වීමට සඳහා තෝරාගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තමාගේ ආබාධිත තත්වය (අංග විකලභාවය) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාව මගින් ඔප්පු කළ යුතුයි.

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් ගෙවා **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ "3401"** යන තැන්පත් ගිණුමට බැර කිරීම සඳහා එම මුදල් කුවිතාන්සිය ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ අලවා යොමු කළ යුතුයි. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු ලබන්නේ නැති අතර මෙම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම් කරන ක්‍රමය :-

08.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයෙන් යුත් (21සෙ.මී x 29 සෙ.මී) කඩදාසියේ 1 සිට 10 දක්වා වූ කොටස පළමු පිටුවේ ද, 11 සිට 14 දක්වා වූ කොටස් දෙවන පිටුවේ ද, ඉතිරි කොටස් අනෙක් කොටසෙත් ආවරණය වනසේ ඉල්ලුම්පත සකස් කල යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 25.07.2018 දිනට හෝ ඊට ප්‍රථම ලබා ගැනීමට හැකි වන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

08.2 එක් තනතුරකට අමතර තනතුරුවලට අයදුම් කිරීමට කැමති අපෙක්ෂකයන් සෑම තනතුරක් සඳහාම වෙන වෙනම ඉල්ලුම්පත් යොමු කළ යුතු අතරම විභාග ගාස්තුද වෙන වෙනම ගෙවීම් කර ලබා ගත් කුවිතාන්සි අයදුම්පත්වල අමුණා එවිය යුතුයි.

08.3 අයදුම්පත / අයදුම්පත්‍ර යොමු කරන ලියුම් කවරයේ වම් කෙළවරේ උඩ කොටසේ **"අයදුම් කරන තනතුරු නාමය"** සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08.4** ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා පූර්ව නිශ්චිත පිටපත් භාර ගනු නොලැබේ. විභාගය සඳහා විභාග ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.5 අයදුම්පත් යොමු කර ඇති සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පුවත්පත් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම නිකුත් කළ පසු කිසියම් අපේක්ෂකයකුහට අවම වශයෙන් විභාගය පැවැත්වීමට දින තුනක් (03) ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලද අපේක්ෂකයෙකු වේනම්, ප්‍රවේශපත්‍ර නොලද බවට පහත සඳහන් විස්තර සමග **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැනුම් දිය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**සටහන :-**

ඉල්ලීම් ලිපියක්, අයදුම්පත්‍රය හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.6 විභාගයට අයදුම් කරන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ලැබුණ බවට දැන්වීම් කිසිවක් නිකුත් කරන්නේ නැති අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසුකම් සපුරා නැති අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කළ හැකි බැවින් මේ සම්බන්ධ දැනුම් දීමක් කලින් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් ඉදිරිපත් වන සෑම විෂයයන්ටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතුයි. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත

(ii) වලංගු විදේශ බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනවලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකු අපේක්ෂකත්වය සඳහ වූ හිමිකම ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු පළාතේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැක. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත විසින් නියම කරන නීතිරීතිවලට අපේක්ෂකයන් සකස් වි යටත් විය යුතුයි. අපේක්ෂකයෙකු එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන අඩුවමකට යටත් විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා අඩුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට අවධානයකින් හා ඉතා නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. මෙම විභාග නීතිරීති වලට අනුව කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව හෝ කුමන අවස්ථාවක වුවද සුදුසු නැති බවට තහවුරු වුවහොත් එම අවස්ථාවේදීම විභාගය සඳහා වන හිමිකම අහෝසි කරනු ලැබේ. අපේක්ෂකයා විසින් ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය යයි තහවුරු වන අවස්ථාව කුමක් හෝ වේවා ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම විභාග අපේක්ෂකයෙක්ම තම අත්සන සහතික කර ගැනීම අනිවාර්ය වේ.** රජයේ ආයතනයකින් අයදුම් කරනු ලබන අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලය ලත් නිලධාරියා මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, සාම විනිසුරු, දිවුරුම් අධිකාරී, නීතිඥ, නොතාරිස්, නාවික, හමුදා, ගුවන් හමුදාවන් හි නියෝගයන් ලද නිලධාරීන්, රුපියල් 240,360.00 ට නොඅඩු වට්නාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියකු, නමස්කාර මධ්‍යස්ථානයන් හි පූජක පක්ෂයෙන් කෙනෙකු සහතික කළ යුතුයි.

## 12. විභාග ක්‍රමය :-

මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍රය දෙමළ හා සිංහල භාෂාවන් දෙකින්ම පැවැත්වීමට නියමිතය. අයදුම් කළ භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙන්නේ නැත. සෑම තනතුරක් සඳහාම විෂය නිර්දේශය පහත පරිදි වේ

12.1 **කෘෂි කර්ම උපදේශක සේවයේ III වන ශ්‍රේණියට හා පුහුණු ගණයේ තනතුරු සඳහා :-**

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | අයදුම්කරුගේ තර්කානුකූල සිතීමේ හැකියාව, අභියෝග්‍යතාවය හා තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යාන්, භාෂා හා රූප ව්‍යුහය යනාදිය අතර ඇති සම්බන්ධතාවය හා ගැටළු විසඳගන්නා ආකාරය ගැන අයදුම්කරුගේ දැනුම මැනීම සඳහා සකස් කර ඇත්. | පැය 01 | 100 |
| 02 | තාක්ෂණික පර්යේෂණ පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය කෘෂිකර්මය සම්බන්ධයෙන් වූ නව නිපැයුම් හා සම්බන්ධ සිතුවිලි හා ගැටළු විසඳීමේ හැකියාව යනාදිය සම්බන්ධයෙන් අයදුම්කරුගේ දැනුම මැනීම සඳහා සකස් කර ඇත. | පැය 01 | 100 |

12.2 **තාක්ෂණික සහකාර (කෘෂිකාර්මික ව්‍යාප්තිය) III වන ශ්‍රේණියේ තනතුර සඳහා :-**

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය තර්කානුකූල හැකියාව්, විශ්ලේෂණ හැකියාව, නිවැරදිව තීරණ ගැනීමේ හැකියාව යන විෂයන් ගෙන් යුත් කරුණු පිළිබඳව අයදුම්කරුගේ දැනුම මැනීම සඳහා සකස් කර ඇත. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනුම (තනතුර හා සම්බන්ධ තාක්ෂණය හා විෂයානුබද්ධ දැනුම) | මෙම ප්‍රශ්න පත්‍රය ලංකාවේ ආර්ථික සංවර්ධනයට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය, ශ්‍රී ලංකාවේ කාලගුණය ජලය සම්බන්ධ දැනුම, පස හා ශාක පෝෂණය, වී නිෂ්පාදනය, අනෙකුත් අතුරු ආහාර වගාවන්, එළවළු නිෂ්පාදනය, පළතුරු, බෝග වගාවන් හි ආරක්ෂාව, පස්වල රසායනිකත්වය, ජල පෙරහන හා එහි වැදගත්කම, ගොවිපළ තාක්ෂණය, මී මැසි පාලනය, උද්භිත වගාව බිම සකස් කර අලංකාර කිරීම, බෝගවගාවන් ආරක්ෂ කිරීම, සත්ව පාලනය, කෘෂි ව්‍යාප්තිය, පටක රෝපණය, උද්භිත ආරක්ෂක පනත සම්බන්ධ දැනුම, ශාබ ආරක්ෂක ජීව විද්‍යා තාක්ෂණය, කෘෂි සංවර්ධනය හා වාරිමාර්ග ජල කළමනාකරණය යන විෂයන් සම්බන්ධයෙන් වූ අයදුම්කරුගේ දැනුම මැන බැලීමේ පරීක්ෂණ සඳහා සකස් කර ඇත. | පැය 01 | 100 |

12.3 **ජලජ ජීවී සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා:-**

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතාව හා සාමාන්‍ය දැනුම | **අභියෝග්‍යතාව :-** මෙම ප්‍රශ්න පත්‍රය අංක ගණිතය, තර්කානුකූල හැකියාව හා සාමාන්‍ය ප්‍රඥාව පිළිබඳව අයදුම්කරුට ඇති දැනුම මැන බැලීම සඳහා සකස් වූවක් වේ. **සාමාන්‍ය දැනුම :-** මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතිය හා තාක්ෂණික විෂයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර හා ජාත්‍යාන්තර දැනුම මැන බැලීම සඳහා සකස් කර ඇත. | පැය 01 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | භාෂණ හැකියාව | කෙටියෙන් ලිවීම, ග්‍රහණයකර ගැනීම, වැරදි හඳුනාගැනීම, පහසු ව්‍යාකරණ භාවිතය යනාදි සම්බන්ධයෙන් වූ අයදුම්කරුගේ දැනුම පරීක්ෂාවට ලක්කිරීමේ අරමුණින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. | පැය 02 | 100 |

**සටහන්** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයකටම වෙන්කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහ බැගින් (40%) අපේක්ෂකයන් ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී තරඟ විභාගයේදී ලබා ගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබාගත් පිළිවෙළට අනුව (Merit Order) සලකා බලනු ඇත.

**13. විභාග ප්‍රතිඵල** :-

අපේක්ෂකයන්ට හිමි විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ඇත. ඉන් පසු විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයන් සැම දෙනාටම තැපැල් මගින් එම ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අහෝසි කිරීම සම්බන්ධයෙන් වූ සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සතුය. දෙමළ සිංහල මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුයි.

**15.** මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිස බලා ගැනීමේ අවස්ථාව ඇත.

**සි. ඒ. මෝහන්රාස්**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
**26.06.2018**